# හෙට වෙනුවෙන් අපි

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි

# හෙට වෙනුවෙන් අපි


**ප්‍රකාශනය ඃ**

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි

77, ශ්‍රී වජිර ඥාන මාවත, කොළඹ - 09

දුරකථන ඃ 0112687091

ෆැක්ස් ඃ 0112686030

E-Mail secretariatsslji@gmail.com

| | |
|---|---|
| Title: | හෙට වෙනුවෙන් අපි |
| Published by : | Sri Lanka Jama`athe Islami<br>No. 77, Sri Vajiragnana Mawatha,<br>Colombo -09 |
| Sinhala Translation : | M.H.M. Hasan BA, PGDE, MEd. |
| First Edition : | 2019 December |
| Price : | 100/= |
| No of Copies : | 1000 |
| Printed by : | IPC<br>No. 3, Devaas Lane,<br>Grand Pass,<br>Colombo -14. |
| ISBN : | 978-955-0787-10-4 |

# පෙරවදන

ඉස්ලාමයේ නාමයෙන් මුස්ලිම් නාමදාරීන් කිහිපදෙනෙකු කල පාස්කු ඉරිදා මරාගෙන මැරෙන පහරදීම ඉස්ලාමය හා මුස්ලිම්වරුන් සම්බන්ධ අවබෝධය උඩුයටිකුරු කල පරිසරයක අපි ජීවත්වෙමු. මෙම පරිසරය කුමන ආකාරයේ බලපෑමක් ඇති කර තිබේද යන්න අප දනිමු.

මෙම තත්වයේදී මුස්ලිම් ප්‍රජාව අවධානය යොමු කළයුතු කරුණු සම්බන්ධයෙන් බොහෝ අය විවිධ  අවස්ථාවල සාකච්ඡා කරන බවත් මෙහි-දී ස්තුති පූර්වකව මතක් කරමින් එම කරුණු ගොනු කිරීමේ ප්‍රයත්නයක් අප දැරූ බවත් මෙහිදී පෙන්වා දෙන්නෙමු.

ඒ සමගම මෙම පොත් පිංචයේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අප විසින් යම් අදහසක් ඉදිරිපත් කිරීම සුදුසු යයි සිතමු.

මෙහි උපදෙස් වශයෙන් ඉදිරිපත් කර ඇති, කරුණු සියල්ල මුස්ලිම් ප්‍රජාව අමතා කරන ඒවා වූවත් එයින් ප්‍රයෝජනය ලබන්නේ මුස්ලිම් ප්‍රජාව පමණක් නොව සමස්ථ රටවැසියන්ම බව සඳහන් කළ හැකිය. එසේ සියළු දෙනා එල ලබන පරිසරයක් ස්ථාපිත කිරීමෙන් අන්තර් ප්‍රජා සම්බන්ධතා වර්ධනය වී ඒ පිළිබඳව අවබෝධය ද වැඩිවෙනු ඇත.

මෙහි ඉදිරිපත් කරන උපදෙස් හුදෙක් පොතට පමණක් සීමා නොකර ඒවා අවම වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමෙන් පමණක් ජනතාවට සෙතක් සලසෙනු ඇත. එසේ වූවද ක්‍රියාත්මක කිරීමට කලින් මෙම උපදෙස් පිළිබඳ සාකච්ඡා කළ හැකිනම්, එහිදී අත්දැකීම් ලද්දන්ගෙන් ලැබෙන වටිනා අදහස්

ලබා ගත  හැකිනම් ඒවා අපටත් ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

වැඩි විස්තර සඳහා
මහ ලේකම්
ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි
77, ශ්‍රී වජිරඥාන මාවත, කොළඹ - 09
දුරකථන : 0112687091
ෆැක්ස් : 0112686030
ඊ මේල්  : secretariatslji@gmail.com

**01.12.2019**

01

# අන්තවාදය මුලිනුපුටා දැමීම

රටේ වර්තමාන වාතාවරණයේ අප සැලකිලිමත්විය යුතු ප්‍රමුඛ කාරණය වනුයේ සුළු වශයෙන් හෝ මහ පරිමානයෙන් හෝ සෘජුව හෝ වක්‍රව හෝ ත්‍රස්තවාදය කරා යන ලක්ෂණ කොතැනක හෝ පෙනෙන්නේ නම් එය මුලිනුපුටා දැමීමෙහිලා අවධියෙන් හා කාර්යක්ෂමව කටයුතු කිරීමයි.

ත්‍රස්තවාදය යනු “එරෙහිවීම” යන්නෙන් (වෙනස්වීම නොවේ) ආරම්භ වී හුදකලාවීම, රහසිගතව ක්‍රියාත්මකවීම රහස් කණ්ඩායම් තුල අසීමිත සෙනෙහසින් හා ගෞරවයෙන් යුතුවීම, පවුලේ සාමාජිකයින් ඥාතීන් සමග ඇති සම්බන්ධය හීනවීම, එසේ නැතිනම් පවුලේ අයත් තමන්ගේ ප්‍රතිපත්තියට හැරවීම උදෙසා ඔවුන් සමග පෙරටත් වඩා ලෙන්ගතුවීම තම කණ්ඩායම් සාමාජිකයින් හැර අන් අය පිළිබඳ තැකීමක් නොවීම යන කරුණුය. එවැනි අය විද්වතුන් උගතුන් වුවත් එසේම වීම, පොදුවේ සැමදෙනා සමග විශේෂයෙන් යම් පාර්ශවයක් සමග දරුණු වෛරයකින් පසුවීම,; ඔවුන් පිළිබඳ ඇති අකැමැත්ත හා විවේචනය මතම තම ප්‍රතිපත්ති හා මතවාදය ගොඩනැගීම, රහස් ආරක්ෂා කිරීම සඳහා බොරුකීම, රැවටීම කුට උපාය උපයෝගී කිරීම, පලිගැනීම, වැනි මෙකී නොකී ලක්ෂණ හෝ ගුණාංගවලින් යුක්තයි.

පොදුවේ එරෙහිවීම හා විවේචනය කරමින් හුදකලාවන ගතිලක්ෂණ ඇත්තන් පහසුවෙන් අන්තවාදයට ආකර්ෂණය වනු ඇත. එමනිසා පවුලේ සාමාජිකයින්, ඥාතීන්, මිත්‍රයින්, ගුරුවරුන්, ප්‍රජා සාමාජිකයින් ආදී සියලුදෙනාම තරුණයින්ගේ විෂයෙහි වැඩියෙන් සැලකිලිමත් විය යුතුය. අන්තවාදී ලක්ෂණ සුළුවෙන් හෝ ඔවුන් තුලින් දිස්වේ නම් වැඩිහිටියන් අවධියෙන් සිටිය යුතුය. මෙවැනි තරුණයින්ගේ හා යහළුවන්ගේ ක්‍රියාකලාප හා ඔවුන්ගේ ගමන්බිමන් ගැඹුරින් නිරික්ෂණය කළ යුතුය. "මගේ පුතා හොඳ ළමයෙකි"යි යන සිතුවිල්ලෙන් සිටීම නුසුදුසුයි.

ආගමටත්, ප්‍රජාවටත්, දේශයටත් හෙට දවසේ මුස්ලිම් ප්‍රජාව ඉටු කළ යුතු දායකත්වයේදී මෙය ප්‍රමුඛත්වය ගත යුතුය. අන්තවාදය මුලදීම හඳුනාගෙන එය වර්ධනය වීම වැලක්වීම සැබෑ ආරක්ෂාවයි.

## 02

# විසමවීම පිළිගැනීම

අන්තවාදය යනු “එරෙහිවීම” යන හැඟීමකින් ආරම්භවන බව ඉහත බැලුවෙමු. “වෙනස්මත දැරීම” එසේ නොවේ. මේ වචන දෙකම එක හා සමාන නොවේ.

වෙනස්මත දැරීම යන්න ස්වාභාවිකයි. එය දයාවෙන් පිරුණු එකකි. නිදහස් චින්තනයේ ප්‍රතිඵලයකි. දැනුම හා පර්යේෂණයට සහායවන්නකි. එරෙහිවීම එසේ නොවේ. එය අනුන්ගේ නිදහසේ අනවශ්‍ය ලෙස මැදිහත්වීමකි. බෙදීම් මුවහත් කරමින් හෙලාදැකීම් හා ක්‍රෝධය වර්ධනය කරන්නකි. සමස්ථයක් වශයෙන් එය සාපයකි.

ඒ නිසා විසමවීම අනුමත කර එරෙහිවීමෙන් ඈත්විය යුතුය. විකල්ප අදහස් බුද්ධිමත් ආකාරයට හා ප්‍රියමනාප භාෂාවෙන් සංවරලෙස සලකා බැලීමේදී එහි අර්ථය, වෙනස් මත අනුමත කිරීම යන්නයි. එනම් ඉවසීමෙන් යුතුව කටයුතු කිරීම යන්න එහි අර්ථයයි. මනඃකල්පිත බව, බොරුව, පරුෂවචන, නිශේධාත්මක විවේචන වෛරීකථා, ක්‍රෝධාකල්ප මගින් ඇමතීමේදී වෙනස්වීම යන ස්ථානයෙන් ගිලිහී එරෙහිවීම යන අනතුර තුලට පිවිසීමට සිදුවේ. එවිට ඉවසීම අපෙන් සඳහටම සමුගෙන යයි.

එය අන්තවාදයේ ආරම්භක අවධියයි. මෙතැනින් ආරම්භවන අන්තවාදය අප මුලින් සඳහන් කළ ලක්ෂණ සියල්ල සමගින් විනාශකාරි ලෙස වර්ධනය වීමට ඉඩ තිබේ. ඇතැම් විට යම් ලක්ෂණ පෙන්නුම් කරමින් නැවතිමට ද ඉඩ ඇත. කෙසේ වෙතත් එය වර්ධනය වන තරමට විනාශයද වර්ධනය වේ.

ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් මෙරටේ ආගම් අතර ඇති වෙනස්කම් අනුමත කරමින් ඉවසීමෙන් යුතුව ජිවත්වන බව තරයේ ප්‍රකාශ කළ හැකිය. බුදු පිළිමවලට හානි කළවුන් හා පාස්කු ඉරිදා පහරදීම සිදුකළවුන් ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසයේ පලමු වතාවට විවිධත්වයේ ඇති වෙනස්කම් එරෙහිවීමට හරවාගත් පිරිසවේ. ඒ හේතුවෙන්ම ඔවුන් මෙරට ඉතිහාසයේ ශාපයක් බවට පත්වූ ආකාරය කව්රුත් දනී.

එහෙත් මුස්ලිම්වරුන් තමන් අතර ඇති වෙනස සම්බන්ධයෙන් ඒවා අනුමත කරමින් ඉවසීමෙන් යුතුව කටයුතු කරනවාදැයි ප්‍රශ්න කලේනම් එහි පිළිතුර “නැත” යන්නයි. මුස්ලිම්වරුන් තමන් අතර ඇති සුළු මතභේද බැරෑරුම් මතවාදයක් බවට පත්කරමින් වාදවිවාද කරගෙන සිටීම ප්‍රතික්ෂේප කළ නොහැකිය.

යුරෝපය ලෝක සංග්‍රාම දෙකකට මුහුණ දුන් කලාපයක්වේ. තමන් අතර තිබූ වෙනස්කම්, එරෙහිවීම දක්වා වර්ධනය කර ඉවසීමෙන් තොරව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙය සිදුවූ බව කිව හැකිය. එහෙත් දෙවෙනි ලෝක සංග්‍රාමයෙන් පසු දීර්ඝ කාලයක් එවැනි යුද්ධයක් හට ගත්තේ නැත. එයට හේතුව වෙනස්කම් අනුමත කරමින් ඉවසීමෙන් කටයුතු කරන තත්වයට ලෝක ප්‍රජාව පැමිණීමයි.

එහෙත් මැද පෙරදිග අරාබි රටවල් තම සහෝදර මුස්ලිම් රටවල් සමග සටන් කරයි. තමන් අතර ඇති වෙනස්කම් අනුමත කර ඉවසීමෙන් කටයුතු කිරීමට අපොහසත්වූ නිසා මෙම විපරීත තත්ත්වය ඇතිවී ඇත. එය එසේනම් දායාදය කුමක්ද ශාපය කුමක්දැයි කල්පනා කළ යුතුව ඇත.

ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් වන අප රටේ ජනයා අතර ඇති වෙනස්කම් වුවත්, මුස්ලිම්වරුන් අතර ඇති විසමවීම් වුවත් ඒවාට එරෙහිවීම දුරදිග යාමට නොදී ඉවසීමෙන් යුතුව සංහිඳියාවෙන් ජීවත්වන තැනකට පැමිණිය යුතුව ඇත.

මෙම විෂයේදී ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ තත්වය පෙරටත් වඩා යහපත් අතට හැරී ඇතිබව පිළිගත යුතුය. එහෙත් තවත් වර්ධනය වීමට දිගු ගමනක් යායුතුව ඇත.

03

# කතාව හා හැසිරීම ශ්‍රීලාංකික විය යුතුය

මුස්ලිම්වරුන් තම ආගමික සමාජීයිය හා මෙලොව ජීවිතය පිළිබඳ සංවාදවලදී මිනිස් වර්ගයාගේ සුභසිද්ධිය, සාමය, ආරක්ෂාව, අනාගතය, මහජන ගැටළුවලට ඇති විසඳුම්, රටේ සංවර්ධනය යන කරුණු තම න්‍යාය පත්‍රයට ඇතුල් කර තිබීම පිළිබඳ සහතික විය යුතුය. ආගමික විද්වතුන් කථා කළත් දේශපාලඥයින් හෝ වෙනත් ප්‍රජා නායකයින් කථා කළත් ඔවුන්ගේ කථා මුස්ලිම්වරුන් වෙනුවෙන් කථාකරන මුස්ලිම් භාෂාවෙන් මෙන් නොවිය යුතුය. හේතුව මුස්ලිම්වරුන් මුස්ලිම් භාෂාවෙන් කරන කථා මෙරටේ ජනයාට නොතේරෙන නිසාය. මෙහි අර්ථය සිංහලෙන් කථා කළයුතු යන්න නොවේ. කතා කරන විෂය හා අන්තර්ගතය මුළු මහත් ජනතාවම නියෝජනය කිරීමක් විය යුතුය.

මුස්ලිම් ප්‍රජාවට දැනට මුහුණ පෑමට සිදුවී ඇති ඛේදජනක තත්තවය පිළිබඳ කතාකිරීමේදී වුවද එයින් අනාගතයේ රටට ඇති විය හැකි පාඩුව පිළිබඳව හා රටේ අනාගතයට එය බලපාන ආකාරය පිළිබඳව කතාකළ යුතුයි.

මුළුමහත් මානව සංහතිය වෙනුවෙන් නිර්මාණය කරන ලද ප්‍රජාවක් තම පුද්ගලික ජීවිතය පිළිබඳව පමණක් කථා කරමින් සිටීම වැරදිය. එයට වෙනස්ව සමාජ ජීවිතය, එහි පැන නැගී ඇති ගැටළු ඒවාට

ඇති විසඳුම් ගැන සාකච්ඡා කළ යුතුය. සිකුරාදා ජුම්ආ දේශනාවල, වෙනත් පොදු දේශනාවල අන්තර්ගතය මේ ආකාරයෙන් වේ නම් මුස්ලිම්වරුන් දේශයේ සුභසිද්ධිය වෙනුවෙන් කටයුතු කරන්නන් බව සෙසු ප්‍රජාවන්ද අවබෝධ කරගනු ඇත. ඒ ගැන සාකච්ඡා කරනු ඇත. එවිට අනෙකුත් ප්‍රජාවන් සමග ඇති සම්බන්ධතාවය වැඩි දියුණුවේ. අන්‍යොන්‍ය සම්බන්ධතාවය හා සහයෝගය වර්ධනය වීමටත් අවස්ථා උදාවේ. එ පමණක් නොවේ. කතාව සමග අපගේ කටයුතු ද ශ්‍රීලාංකිකවීම පිළිබඳ අප සහතික විය යුතුය. අප සෞදි අරාබිය ජනයා මෙන්, පාකිස්තානයේ හෝ ඊජිප්තුවේ ජනයා මෙන් ජීවත්වී මෙරටේ වැසියන් සමග පරතරයක් ඇතිවෙන ආකාරයට ක්‍රියා නොකළ යුතුය.

ප්‍රජා අතර පරතරය වැඩි කරන සාධකයක් වශයෙන් මෙය කතාබහට ලක්වෙන තත්ත්වයකදී අප ඒ පිළිබඳ නොසලකා හැරීමෙන් හානියක් සිදුවිය හැකිය.

සංකේත වෙනස්කම් යනු සරල ඒවාය. එහෙත් එම වෙනස්කම් උලුප්පා දක්වමින් ඇතැම්විට සංස්කෘතික ආක්‍රමණයක් ලෙස පෙන්වමින් ප්‍රජා අතර පරතරය හුවාදක්වන ප්‍රයත්නයන් ගනු ලැබේ. එවැනි ප්‍රයත්න සාර්ථක කිරීමට අපත් දායක විය යුතු ද?

එම නිසා කථාවෙන් හා හැසිරීමෙන් ප්‍රියමනාප තත්ත්වයක් ඇති කර ගැනීම වර්තමානයටත් අනාගත පරපුරටත් ඵලදායී වනු ඇත.

04

# විවෘත භාවය

කතාව හා හැසිරීම ශ්‍රීලාංකික විය යුතුයි යන මාතෘකාව යටතේ අප සාකච්ඡා කළ කරුණු ක්‍රියාවට නැංවූ විට තවත් වාසියක් අත්වේ. එනම් අප සැමවිටම විවෘත භාවයෙන් කටයුතු කළ යුතු වීමයි.

අපගේ කතා හා හැසිරීම් අප රටේ අනාගත සෞභාග්‍යය හා එහි යහපත් අනාගතය පෙරදැරි කරගත් වූවක් නම්, ඒ ආකාරයෙන්ම මිනිසුන්ගේ ගැටළුවලට මුල්තැන ලබාදී ඒවා විසදීම සම්බන්ධයෙන් ධනාත්මකව කටයුතු කලවිට, එයින් ගම්‍යවන්නේ අප සියළු දෙනා සමග සිටිනවා යන්නයි. එය අවබෝධ කරගැනීමේදී කිසිවෙකුටත් ප්‍රශ්නයක් ඇතිනොවේ යන්නයි.

එමෙන්ම සහෝදර ප්‍රජා සමග සන්නිවේදනයේ යෙදීමේ කැමත්තක් දැක්විය යුතුය. මිත්‍රත්වය පදනම් කරගත් සුහදශීලි හමුවීම් ආශ්‍රයෙන්, සිංහල භාෂාවෙන් සිදුකරන මාධ්‍ය සාකච්ඡා මගින්, වෙළඳ සංගම්, වෘතීය සමිති මාර්ගයෙන් හා තවත් විවිධ ක්‍රම ඔස්සේ සන්නිවේදන අවස්ථා වැඩිදියුණු කරගත යුතුය. එවැනි සන්නිවේදන වලදී ජනතාව මුහුණ දෙන දැවෙන ප්‍රශ්න කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබාදිය යුතුය. මුස්ලිම් ප්‍රජාවගේ ගැටළු සාකච්ඡා කරන අවස්ථාවලදී පවා එය ශ්‍රීලාංකේය

ජනයාගේ ප්‍රශ්නයේ කොටසක් වශයෙන්ම පෙන්වාදීම යහපත්ය.

එපමණක් නොව අපගේ සංචාරයන්, සහෝදර ප්‍රජාවල උරුමයන් හඳුනා ගැනීමේ ඓතිහාසික වටිනාකම් අවබෝධ කරගැනීමේ අදහසින් සැළසුම් කැරේ නම්, පාසල් අතර සම්බන්ධතා වර්ධනය වන අයුරින් යොදා ගැනේනම් ඒවා තුලින් අපගේ විවෘත භාවය පිළිබිඹුවේ.

මේ ආකාරයෙන් හා තවත් බොහෝ ක්‍රියාමාර්ග මගින් විවෘත ප්‍රජාවක් වශයෙන් (හුදකලා ප්‍රජාවක් නොවී) කටයුතු කිරීම වැදගත්ය. භාෂා දැනුම මෙයට බාධාවක් නොවීමට ජාතික භාෂා ඉගෙනගැනීමට උනන්දු වීමද ඉතා වැදගත්ය.

## 05

# නීතිය පිළිබඳව  දැනුවත්වී ක්‍රියා කිරීම

ආගම පිළිබඳ දැනුම මුස්ලිම් ප්‍රජාව තුල වර්ධනය කිරීමට කටයුතු කරනවා වගේම රටේ නීතිරීති පිළිබඳවද මුස්ලිම්වරුන් දැනුවත් කළ යුතුය. නීතිය හා සාමය පිළිනොපැදීම සහ අනාවබෝධයෙන් පසුවීම සහජීවනයට බාධාවක්වන සාධකයන්ය.

එමෙන්ම, නීතිය හා සාමයට ගරු කිරීම අනවශ්‍ය කරදරවලින් ආරක්ෂාවීමට උපකාරීවේ. චුදිත ආකල්පයෙන් ක්‍රියා කිරීමේ තත්වයෙන් ද මිදිය හැකිය. එයින් සිත සමනයවේ. අර්බුද අවමවේ.

නිවස, ව්‍යාපාරය, වතුපිටි ආදියෙහි විස්තර, මුදල් ගනුදෙනුවල ලියකියවිලි, ආදායම්, ආදායම් බදු සම්බන්ධ වාර්තා ගිණුම් වාර්තා වැනි සියළු ලේඛන නිත්‍යානුකලව හා ප්‍රමිතියෙන් යුතුව තිබේද යන්න සහතික විය යුතුය.

ලොකු කුඩා සියළු කටයුතු නීතිය අවබෝධය කරගෙන ක්‍රියාත්මක කිරීමේදී එයට සහයෝගය හා සහාය ලැබීම නියතයි. නීතිය හා සාමයට එරෙහිව ක්‍රියා කිරීමේදී අනවශ්‍ය අපහසුතාවලට මුහුණ දීමට සිදුවනු ඇත. ඇතැම් විට කීර්ති නාමයට ද හානියක් වනු ඇත.

රට හඳුනා ගැනීම යන්නෙහි රටේ නීතිරීති අවබෝධ කර ගැනීමත් අඩංගුවී ඇති බව කිව හැකිය. නීතිරීති හා විනය පිළිබඳව දැනුවත්වීමත් ඒවා නිසියාකාරව ක්‍රියාත්මක කිරීමත් වැදගත් වන බව අවබෝධ කරගත යුතුවේ.

## 06

# ප්‍රමිතිය රැකගනිමින් නිවැරදිව කටයුතු කිරීම

දඩි බිඩි ගා වැඩ කිරීම වෙනුවට කල්පනාවෙන් වැඩ කිරීමේ සංස්කෘතිය පිළිපැදිය යුතුය. ලොකු පොඩි ඕනෑම කාර්යයක් ප්‍රමිතියක් සහිතව කිරීමට යුහුසුළු විය යුතුය. කුඩා තේ කඩයක් වුවද නවීන තාක්ෂණයෙන් යුතුව පිරිසිදුව, ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අප පුරුදු විය යුතුය. පෙර පාසල්, ජාත්‍යන්තර පාසල්, කුර්ආන් පාසල්, අරාබි විදුහල්, මස්ජිද් (පල්ලි) ව්‍යාපාර ආයතන වැනි ඕනෑම ව්‍යාපෘතියක් සුදුසු කළමනාකරන ක්‍රමවේද අනුව ක්‍රියාත්මක කිරීමට උනන්දු විය යුතුය. මෙවැනි ආයතන සම්බන්ධයෙන් නගන ඕනෑම ප්‍රශ්නයකට වහාම පිළිතුරු සැපයිය හැකි ආකාරයේ ක්‍රමවේද යක් තිබිය යුතුය.

කුමන ආයතනයක් හෝ ව්‍යාපෘතියක් වුවද එහි ඵලය කරුණු තුනක් ඔස්සේ ඉදිරිපත් කිරීම ප්‍රයෝජනවත්ය.

(1) ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියෙන් කළමනාකරණයට හෝ ආයතනයට ලැබෙන ප්‍රතිලාභ

(2) නියමිත ව්‍යාපෘතියෙන් හෝ ආයතනයෙන් සමාජයට ලැබෙන ප්‍රතිලාභ

(3) නියමිත ව්‍යාපෘතියෙන් හෝ ආයතනයෙන් රටට ලැබෙන ප්‍රතිලාභ

මෙම තුන් වර්ගයේම දායකත්වය කිසියම් හෝ ප්‍රතිශතයකින් තිබීම සහතික කිරීමට හැකිනම් රට සම්බන්ධයෙන් අපගේ ආකල්පය දැනට වඩා යහපත් ප්‍රගතියක් කරා ගමන් කරනු ඇත.

කිසියම් හෝ ප්‍රතිශතයක් තිබීම පිළිබඳව සහතික කිරීම හා රටට දායකවීමේදී පෙරටත් වඩා ඉහල තත්වයකට පත්වීමට මෙම වර්ගීකරණය ඉවහල්වේ.

## 07

# පෙරට ම යාම

නබි මුහම්මද් තුමා මෙලොවේ සිදුවිය හැකි අයහපත් හා යහපත් දෑ පිළිබඳ අනාවැකි එලකර ඇති බව අප දනිමු. එසේ කී අනාවැකිවලින් අපට ලබාගත හැකි පාඩමක් වනුයේ අනාගතය පිළිබඳ අපේක්ෂාකාරීව පෙරට යා යුතුය යන්නයි. අතීත සිදුවීම් හා එයින් ඇතිවූ තත්වයන් සිතමින් දුක්වෙමින් සිටීමෙන් පලක් වන්නේ නැත.

ඉදිරියට එන හානිදායී තත්වයන් ගැනම සිතා කනගාටු නොවන්න. අධිෂ්ඨාන පූර්වකව පෙරට යන්න. ජීවිතය සමතලා බිමක ගමනක් නොව, කඳු හා පල්ලම් තරණය කළ යුතු ගමනකි. ඒනිසා ආපසු හැරීම පසෙකලා ඉදිරියටම යන්න. අළුත් පරිසරය කුමක් වුවද ඊට සරිලන ආකාරයට ඔබව හැඩගස්වා ගන්නඃ එවැනි යතාර්ථ නබිතුමාගේ වැකිවලින් අපට දැනගත හැකිය.

මෙම සත්‍යය අවබෝධ කරගත හැකිනම් අපි අතීතය භාරා අවුස්සමින් නොසිටිමු, ඉස්ලාමීය සාරධර්ම හා අගයන් අනුගමනය කරමින් අප අළුත් පරිසරයට ප්‍රවිශ්ඨ විය යුතුය. එම පරිසරය හැදෑරිය යුතුය. පැරණි සිරිත් විරිත් අතහැර දමා අළුත් පරිසරයේ ජීවත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ කල්පනා කරමු. එසේ කල්පනා කරන්නේ නම් ඉවත් කළ යුතු පැරණි දේවල් හෝ අත්පත් කරගත

යුතු අළුත් දේවල් හෝ අපට බරක් වන්නේ නැත.

කාලය, ස්ථානය, පරිසරය, සම්ප්‍රදාය ආදිය වෙනස්වන විට (ෆත්වා) විනිශ්චයද වෙනස්වේ යනුවෙන් ඉස්ලාමීය නීතිවේදයේ ඇති වගන්තිය අපට කියාදෙන්නේ ද එම කරුණුමය.

එහෙත් මුස්ලිම්වරුන්ගෙන් බොහො දෙනෙක් 4/21ට පෙර යුගයේම ජීවත්වීමට කැමතිවෙති. පස්වාද් 4/21 පරිසරයට ඔවුන් තවමත් අවතීර්ණ වූයේ නැත. ඔවුන් උත්සාහ කරන්නේත් 4/21ට පෙර තත්වයට යාමටය. අළුත් පරිසරය සමග එකඟවී යාමට නොවේ. හේතුව අළුත් පරිසරයට ගැලපෙන ආකාරයට වෙනස්වීම් දුෂ්කරය. සුපුරුදු පරණ පරිසරයේම සිටිමින් ජීවත්වීම පහසුයි. මේ තත්ත්වය කොහෙත්ම යහපත් නොවන බව අවබෝධ කරගත යුතුය.

සැබෑ තත්ත්වය නම් අප කැමති හෝ අකමැති වුවද ලෝකය වෙනස්වෙමින් පවතී යන්නයි. එහිදී වාසි සහගත වෙනස්කම් පමණක් නොව අවාසිසහගත වෙනස්කම් ද ඇතිවිය හැකිය. ස්වභාවික වෙනස්කම් ද කෘතිම වෙනස්කම් ද ඇතිවේ.

වෙනස්කම් කුමන කෝණයෙන් පැමිණියද ස්ථාවර පදනම මත දැඩිව සිටිමින් ඒවාට මුහුණ දී පාඩම් ඉගෙන ගෙන එම වෙනස්කම් අනුව තමන්වද හැඩගස්වාගෙන අළුත් මාර්ගයක ගමන් කිරීමට අපොහසත් වන්නන් ඓතිහාසික ප්‍රවාහයෙන් ඉවත් කරනු ලබති.

එම නිසා පස්වාද් 4/21 යුගයට පිවිසෙමු. මේ කාලයට අවශ්‍ය මගපෙන්වීම් ලබාගනිමු. ඒවායේ ආධාරයෙන් සාමකාමී ප්‍රජාවක් වශයෙන් තවදුරටත් පෙරටම යමු.

08

# රෝගයේ සැරභාවය අඩු කරගැනීම

ශ්‍රී ලංකාවට නියඟය නම් එය ශ්‍රීලංකාවාසින්ගේ ගැටළුවකි. ශ්‍රී ලංකාවට ගංවතුරනම් එයත් ශ්‍රී ලංකා වැසියන් එකමුතුව මුහුණ දිය යුතු ප්‍රශ්නයකි.

සූර්යයා උදාවීමත් බැසයාමත්, දහවල් හා රාත්‍රිය ඇතිවීමත්, සෘතු වෙනසත් ශ්‍රීලංකාවේ වෙසෙන යම් පිරිසකට නොව සියළු දෙනාටම බලපාන බව අපි දනිමු.

එමෙන්ම ශ්‍රීලංකාවේ දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වන රෝග ලක්ෂණයක් වශයෙන් ජාතිවාදය සඳහන් කළ හැකිය. එක් ජාතියක් තවත් ජාතියකට එරෙහිව එය භාවිතා කරනු ලැබුවද වින්දිතයන්ට පමණක් බලපාන ප්‍රශ්නයක් වශයෙන් එය පවතින්නේ නැත. එය ශ්‍රීලංකාවේ ගැටළුවකි. ලෝකය ඒ දෙස බලන්නේ එම අර්ථයෙනි. මෙම රෝගය සනීප කළ යුත්තේද ශ්‍රීලංකාවේ ජනතාවමය. ඔවුන් එය සුව කරයි ද තවත් උත්සන්න වනතෙක් බලාගෙන සිටීදැයි නොදැනේ. කෙසේ වෙතත් රෝගයේ සැර භාවය උත්සන්න වනවා මිස අඩුවීමක් පෙනෙන්නට නැත. ඒ නිසා මෙම රෝගය උත්සන්නවීම වලක්වාලීමෙහිලා නිතර අවධානයෙන් අප සිටිය යුතුය.

එවැනි නිගමනයකට අප පැමිණියහොත් එම රෝගය අපගේ වැරදි හැසිරීම නිසා උත්සන්න නොවීමට අප වග බලාගත යුතුයි. එයට අප ප්‍රමුඛත්වය ලබා දියයුතුයි. අනෙක් පැත්තෙන් රෝගය වර්ධනය කිරීමට ගන්නා උත්සාහයන් සාවධානයෙන් හා සාමකාමීව අවශ්‍ය වුවහොත් නීතියේ ආධිපත්‍ය මගින් වැලක්වීමට කටයුතු කළ යුතුය.

රෝගය වර්ධනය වීම කෙරෙහි අපගේ කුමන හැසිරීම් දායක වන්නේදැයි ලැයිස්තුගත කර (කුඩා හා ලොකු) ඒවා ක්‍රමයෙන් ඉවත් කිරීමට හැකිවන සේ ඒ පිළිබඳව සමාජය දැනුවත් කළ යුතුය. ප්‍රජා සංවිධාන, ආගමික සංවිධාන මේ කටයුත්ත නාභිගත කරමින් ක්‍රියාත්මක විය යුතුය.

නුසුදුසු කථා හැසිරීම් රටා, සමාජ මාධ්‍ය භාවිතය, විනය විරෝධී ක්‍රියා වැනි සියල්ල රෝගය උත්සන්න කිරීමෙහිලා දායකවන බව අමතක නොකළ යුතුය. අපගේ ක්‍රියාවන්හි මෙය සැලකිල්ලට ගත යුතුමය.

4/21 ත්‍රස්තවාදී පහර දීම සිදුකළ කල්ලිය හැර අනෙකුත් මුස්ලිම්වරුන් මෙම රෝගය පිළිබඳ අවදියෙන් සිටින බව කිව හැකිය. එහෙත් පෙරට වඩා වැඩි සැලකිල්ලක් වර්තමානයේ අවශ්‍යවේ.

09

# අනන්‍ය බව හා පොදු බව

ඕනෑම ප්‍රජා අතර හෝ ජනයා අතර මතභේද දැකිය හැකිවේ. මතභේද නිසා සෑම ප්‍රජාවක්ම කොටස්වලට බෙදී ඇති බව සැබෑය. මුස්ලිම් ප්‍රජාවටද එය පොදුය.

මුස්ලිම් ප්‍රජාව මෑත අතීතයේ මෙම මතභේද ගැටුම් බවට පත්කර මින් ගැටළු ඇති කරගත් බව පෙනෙන්නට තිබුණි. එහි ප්‍රතිවිපාක භුක්ති විඳීමේ කාලය දැන් එළැඹී ඇත. මෙය නිරාකරණය කරගත යුතුයි. එය නිරාකරනය කිරීම යනු ශතවර්ෂයක් ආපස්සට ගමන් කිරීම නොවේ. වසර සියකට පෙර මෙවැනි ගැටළුවක් නොතිබුණි යනුවෙන් කථා කිරීමෙන් මෙම ගැටළුව විසඳිය නොහැකිය. තරුණ වියේ තිබූ මනා සෞඛ්‍ය තත්වය පිළිබඳව කථා කිරීමෙන් වැඩිහිටි වියේ අභියෝගවලට මුහුණ දිය නොහැකිය.

වර්තමානයේ ශ්‍රී ලංකා මුස්ලිම් ප්‍රජාව විවිධ සංවිධාන වශයෙන් බෙදී සිටීම යථාර්ථයකි. එම යථාර්ථය පිළිගෙන එයින් මතුවී ඇති ප්‍රශ්නවලට විසඳුම් සෙවීම අපගේ වගකීමකි. ඒ සඳහාවූ මාර්ගය නම් සියළු දෙනාගේ නිදහසට ගරු කිරීමට ඉගෙන ගැනීමයි. එවිට එක් එක් අයගේ අනන්‍යතාවලට තර්ජනයක් නොමැති බව සහතික වේ.

ඉන් අනතුරුව සඳහන් කළ යුතු හෝ ප්‍රශ්න කළ යුතු කරුණු

තිබේනම් ඒවා ශිෂ්ට ලෙස ප්‍රියමනාප භාෂාවෙන් බුද්ධිමත් අන්දමින් අවංකබව ප්‍රකාශවන අයුරින් ඉදිරියට ගෙනයායුතුය. නොදැන හෝ සොයා බැලීමකින් තොරව කිසිවක් ප්‍රජාව ඉදිරියේ තැබීමට යුහුසුළු නොවිය යුතුය.

ප්‍රජාවේ ඇති කිසියම් පාර්ශවයක් (ආගමික හෝ දේශපාලනික) අනෙක් පාර්ශවයේ පැවත්මට තර්ජනයක් ලෙස සැලකිය යුතු නැත. (අන්තවාදයට උඩගෙඩිදෙන අය හැර), අන්තවාදය එහි ලක්ෂණ සමගින් (2,3 පිටු බලන්න) උත්සන්නවීම දැනුණුවිට ප්‍රජා නායකයින් එක්වී සාකච්ජා කර වහාම ආරක්ෂිත පියවරවල නිරතවිය යුතුය.

සියලු පාර්ශව තමන්ගේ හා අන් අයගේ අනන්‍යතාවලට තර්ජනයක් නොවන ආකාරයට කටයුතු කරයි නම් ඒ සැම එක්වී ප්‍රජාවේ පොදු යහපත කෙරෙහි හා ජාතියේ (රටේ) සුභසිද්ධිය වෙනුවෙන් අවධානය යොමු කිරීමෙන් ක්‍රියාත්මක වීමට හැකිවනු ඇත. ප්‍රජා හා ජාතිය යන දෙකම ආරක්ෂක තාප්පයන් වැනිය. එම තාප්පවල එක් එක් පාර්ශවයන් තම චිත්‍රය නිර්මාණය කර ඇත. එක් පාර්ශවයකගේ චිත්‍රයට තමන් අකමැති නිසා තාප්පයේ එම ස්ථානය කඩා දැමීම අඥාන ක්‍රියාවකි. හේතුව තාප්පයේ කුමන හෝ ස්ථානයක් බිඳ දමන විට සමස්ථ තාප්පයටම එය හානි කරවේ. ඒ නිසා ප්‍රජාව සහ දේශය යන තාප්ප ආරක්ෂා කිරීම සියළු දෙනාගේම වගකීමයි. එය පරාර්ථකාමී වගකීමක් ද වේ. එහිදී සියළු දෙනාම එක්සත් විය යුතුය.

මෙම ප්‍රවේශය ප්‍රජාවේ හා දේශයේ වැදගත් කොට සැලකුවේ නම් එය සියළු දෙනාගේ යහපත ආරක්ෂා කරන්නක් වේ. එයට ලෝකයේ ඕනෑ තරම් නිදර්ශන ඇත.

10

# කෙටි ආයුෂ සහ දීර්ඝායුෂ

වර්තමානයේදී කුකුලන් ඇති කරන්නන් දින 18කින් බ්‍රොයිලර් කුකුලන් හදා ආහාරය සඳහා විකුණති. දින 48කින් ලොකු මහත් කරන තවත් බ්‍රොයිලස් වර්ගයක්ද ඇත. ඔබ කැමතිවන්නේ කුමන වර්ගයට ද?

කඩිනමින් ආහාරයට ගැනීමට ඇතැමුන් ආශා කරති. එවැනි ක්ෂණික ආහාර ශරීරයේ විෂ මිශ්‍ර කිරීමටත් අසාමාන්‍ය සංකූලතා ඇති කිරීමටත් මගපාදන වග හදිසිය හේතුවෙන් ඔව්හු අමතක කරති.

කුමක් වුවද වර්ධනය වීමද යම් නියමයට අනුකූලව සිදුවේ. සීඝ්‍රයෙන් වර්ධනය වන ඒවා සීඝ්‍රයෙන්ම බිඳවැටීමටද ඉඩ ඇත. ක්‍රමානුකූලව වර්ධනය වන ඒවා දිගුකල් පවතින්නේය.

මිනිසුන්ව ජාතිවාදයෙන්, ආගම්වාදයෙන්, ක්‍රෝධයෙන්, වෛරීමතයෙන් ක්ෂණිකව ප්‍රකෝපයට පත්කළ හැකිය. සෙනෙහසින්, යහපත් ගුණාංගවලින් මානවහිතවාදයෙන් ඔවුන්ව වර්ධනය කිරීමට උත්සාහ කලහොත් එවැනි වර්ධනය ක්ෂණිකව සිදු නොවේ.

කව්රුන් හෝ ඉක්මන් වීම නිසා අප ඉක්මන් විය යුතු නැත. අන්තවාදීන් හා ත්‍රස්ථවාදීන් ඉක්මන්වී කුමක් කළේ ද යන්න අපි දනිමු..

ළදරුවන්, පාසල් ළමුන්, තරුණයින්, කාන්තාවන්, වැඩිහිටියන්, උගතුන්, නුගතුන් යන සියල්ලම සෙනෙහසෙන් ආදරයෙන් යහපත් ගතිගුණවලින් මානව දයාවෙන් වර්ධනය කිරීමට උත්සාහ දරන්න. එම වර්ධනය අදෘෂ්‍යමාන වර්ධනයයි. එහෙත් එය ස්ථිර සාරයි. එහි ඵලය අප භුක්ති වින්දේ නැතත් අපගේ ඊළඟ පරම්පරාවේ අය හෝ භුක්ති විඳිනු ඇත. ක්‍රෝධය, හතුරුකම, වෛරය යනාදිය වර්ධනය කලහොත් අපටත් වඩා අපගේ ඊලඟ පරම්පරාවේ කාලය තර්ජනාත්මක විය හැකිය.

බෙලහීනයින්ගේ බලය ඇත්තේ යහගුණාංගවල හා යහ ක්‍රියාවල බව තරයේ විශ්වාශය කරන්න. හේතුව ලෝකයේ කිසිම හමුදාවකින් එය පරාජය කරන්නට පුළුවන් කමක් නැත.

ත්‍රිස්තවාදීහු යහගුණාංග අහිමි කරගත්හ. යහක්‍රියා අහිමි කර ගත්හ. අවසානයෙන් ඔවුන් තමන්ම විනාශ කරගත්හ. රටටද මහා විනාශයක් ඇති කළහ.

යහගුණාංගවලින් හා යහ ක්‍රියාවලින් කිසිවක් විනාශ කල නොහැකිය. ඒවායින් කරන්නේ අළුත් යමක් නිර්මාණය කිරීමය. එහෙයින් දුක අමතක කර යහගුණාංග සහ යහ ක්‍රියා වර්ධනය කිරීමට උනන්දු වන්න.

11

# පැවැත්ම හා ආරක්ෂාව

ජාතික ආරක්ෂාව සඳහා වූ අපගේ යුතුකම් පිළිබඳ පළමු පරිච්ඡේදයේ විස්තර කළෙමු. මෙහිදී මුස්ලිම් ප්‍රජාවේ ආරක්ෂාව පිළිබඳ කරුණු කිහිපයක් සාකච්ජා කිරීමට අපේක්ෂා කරමු.

අපගේ ජීවිතය හා දේපල පිළිබඳව ආරක්ෂාව වැදගත් ස්ථානයක් ගනී. ආරක්ෂාවට ඇති තර්ජන පිළිබඳ අනුමාන කළහැකිනම් පෙරසූදානමක් වශයෙන් කුමක් කළ යුතුද? කිසියම් සිදුවීමකින් පසු කුමක් කළ යුතුදැ? යි යන්න පිළිබඳව අවබෝධයක් රටේ නීති පද්ධතිය තුලින් ලබාගත යුතුය. නීත්‍යානුකූල නොවන කිසිවක් කිරීමට උත්සුක නොවිය යුතුය.

මේ සම්බන්ධව නීති නියමයන් පිළිබඳ දැනුවත් පිරිස තම ප්‍රදේශවල සිටින බව සහතික කරගත යුතුය. නියමිත කාරණා පිළිබඳව ජනයා තුල අවබෝධයක් ඇති කළ යුතුය.

තර්ජනයක් ඇති බව අපේක්ෂා කරන අවස්ථාවේ සිටම සිද්ධියකට මුහුණ දීම දක්වා ඇති සියළු අවස්ථාවල කටයුතු කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ නීතිය මගින්ම අවබෝධ කර ගත යුතුය. නිත්‍යානුකූලවම ඒවා ක්‍රියාත්මක කළ යුතුය.

ජීවිත හා දේපල ආරක්ෂා කර ගැනීම සඳහා නීතිය මගින් විධිවිධාන යොදා ඇත. ඒ අතර නීතිය හා සාමය ආරක්ෂා කරන හා ඒවා ආරක්ෂා කිරීම සහතික කරන ආයතනද ඇත. මේ පිළිබඳ අවබෝධයෙන් අප කටයුතු කළ යුතුය.

එවැනි ආයතන සමග සමීප සම්බන්ධතා ගොඩනඟාගෙන එම ආයතනවලින් උපදෙස් ලබාගෙන ක්‍රියාත්මක කිරීම අපටත් රටටත් පලදායිවනු ඇත.

12

# තාප්ප වෙනුවට පාලම් හදමු

සමබිමේ බිත්ති අතර එකට සිටි අයව දෙකඩ කිරීමට පිරිසක් උත්සහ දරති. බැවුම් අතර පාලම් නිර්මාණය කර විශාල හිඩැස පිරවීමට තවත් පිරිසක් තැත් කරති.

අප දෙවෙනි වර්ගයට අයත් විය යුතුය. ඔවුන් සමග එක්වී කටයුතු කළ යුතුයි. ඔවුන් කව්රුන් වුවද මේනයින් තාප්ප හදන මේසන් වරුන්ට වඩා පාලම් හදන ඉන්ජිනේරුවන්ගේ අවශ්‍යතා අද වෙනදාටත් වඩා අවශ්‍ය බව අවබෝධ කර ගත යුතුය.

වචන හැසිරීම්, ඇඳුම් පැළඳුම් විලාසිතා, වෙළෙඳ ව්‍යාපාරික කටයුතු, මාර්ග නීති, උත්සව ක්‍රම, දේශපාලන ක්‍රියාකාරකම්, මැතිවරණ ප්‍රචාරක ක්‍රමවේද, ආගමික දේශනා වැනි ජීවිතයේ සියළු කටයුතු අමුද්‍රව්‍ය වශයෙන් භාවිතා කරමින් අප මේ පාලම නිර්මාණය කළ යුතුයි,

මෙය සරල කාර්යයක් නොවේ. ඇතැමුන් ආගමෙන් පවුරු හදති. ඒ අතර ඇතැමුන් වෙළඳාමෙන් පාලම් නිර්මාණය කරති. කෙනෙක් ගොඩනගන දෙයක් තවත් කෙනෙක් නොබිඳ සිටීම ඉතා වැදගත්ය. මෙවැනි විෂමතා අතීතයේ තිබුණා විය හැකිය. එහෙත් ඉදිරි කාලවලදී ඇතැම් පිරිස් ගොඩනැගීමටත් තවත් පිරිසක් බිඳ දැමීමටත් ඉඩදිය

නොහැකිය. එසේ නොමැතිනම් කිහිප දෙනෙක් පාලම් ගොඩනගනවිට තවත් පිරිසක් තාප්ප ගොඩනැගීමද කළ නොහැකිවේ.

සුළු සිද්ධියක් වුවද ඇතැම් අවස්ථාවලදී පවුරක් නිර්මාණය කිරීමට සමත්වෙයි. නැතහොත් ගොඩනගමින් තිබෙන පාලමත් බිඳ දැමිය හැකිය, යන්න බොහෝ දෙනෙකුට නොතේරේ. මෙවැනි වැරදි පිළිබඳව විවෘතව පෙන්වා දුන්විට ඔවුන් අපේ ඇඟට කඩා වදිනු ඇත.

එසේ නොමැතිව පාලම් ගොඩනැගීම් කාර්යය සියළු දෙනාගේ සාකච්ඡාවකින් පසු ගන්නා තීරණයක් අනුව සිදුවිය යුතුය.

ගෙවල්වල තාප්පය අහස උසට බැඳීම අවම කරමින් පාලම් ගොඩනඟන කාර්යයට කාලය ශ්‍රමය වැඩියෙන් වැය කිරීමට කව්රුත් උත්සුක විය යුතුය. සමබිමේ තිබූ දේශය හා ප්‍රජාව අගල්වලින් බෙදී යන තත්වය ඇතිවී තිබෙන පරිසරයක පාලම අමතක කරමින් තාප්ප නිර්මාණ කරන කාර්යයේ නිරතවිය හැකිද? එක් එක් පාර්ශවයට තමන්ගේ ආරක්ෂාව සලසා ගැනීමට බල කැරෙන තත්වය අවතක්සේරු කිරීමට උත්සාහ නොකළ යුතුය. ඒවගේම ප්‍රජා අතරවූ පාලම පලුදුවී ඇති බවත් එම පලුද්ද මුස්ලිම් ප්‍රජාවගේ පැත්තෙන් පිළිසකර කිරීමට ඇතිබවත් අප ප්‍රතික්ෂේප නොකළ යුතුය. ඒ සඳහා වූ එකතුවීමට හා සාකච්ජාවට වර්ථමානයේ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.

# 13

## පුළුල් මනස

විවිධ හේතූන් නිසා ලෝකය අර්බුධකාරී ලෙස වෙනස්විය හැකිය. ස්වභාවයෙන්ම ලෝකය කොතරම් විශාල  වුවද

තවත් විවිධ හේතූන් නිසා මනස පුළුල් විය හැකිය. එය කොතරම් අර්බුදයක පැටලී තිබුණ ද,

4/21 ප්‍රහාරයෙන් පසු පුළුල් අවකාශයත් සුවිශාල මහපොළවත් එක්තරා ආකාරයට අපට හැකිලී ගොස් තිබුණි. ඒ නිසා ඇතැමුන් රටම අතහැර යන්නට ගොස්ය. යන්න සූදානම් වන පිරිසක් ද සිටිති. ඔවුන් ලෝකය දෙස බැලුවා මිස මනස දෙස බැලුවේ නැතැයි පෙනේ.

ලෝකය පුළුල්විය හැකිය. කුඩාවිය හැකිය. එහෙත් මනස පටුවීමට ඉඩ දිය නොයුතුය. මනස පටු වුවහොත් ජීවත්වීම අසීරුය. මනස හැකිලීම නවතාලීමට කළ යුත්තේ එකම දෙයකි.

උසස් චින්තන ආශ්වාස කළ යුතුය. එවිට මනස පුලුල්ව පවතී. උතුම් සිතුවිලි බිහිවෙමින් පවතී.

උදාහරණයක් වශයෙන් "සියලු මානවයින් ආදම්ගේ පරම්පරාවයි, එක මවකගේ දරුවන් ය" යන චින්තනය කෙනෙකුගේ සිතේ තැන්පත්වූ

විට මිනිස් සමාජයේ සිටින යහපත් අයහපත් මිනිසුන් සියල්ල එකම පවුලක් ලෙස බලයි. එක මවකුගේ දරුවන් අතර යහපත් හා අයහපත් දරුවන් සිටිය හැකිනම් ආදම්ගේ පරම්පරාවේ එවැනි අය සිටිය නොහැකිද? සිටිය හැකිනම් පවුලක් වගේ එයත් සලකන්න බැරිද? නබිවරුන් මිනිස් සමාජය දෙස බැලුවේ ඒ ආකාරයටයි යන්න අප සිහියට ගත යුතුය.

එසේ නොසිතා මිනිසුන් දෙස වාර්ගික භේදයකින්, පන්තිභේදයකින්, භාෂා භේදයකින් බලන කල ඔහුගේ සිත ඔහුගේ වර්ගයට පමණක් වී ඔහුගේ කුලයට පමණක් සීමාවී හැකිලි යයි. අනෙකුත් සියලු දෙනා ඔහුගේ මනසින් ඉවත්වෙයි. එවැනි අයෙකුට වෙනත් වාර්ගිකයින් සමග ජීවත්වීම කෙසේ වෙතත් ඔවුන් සමග වූ ආශ්‍රය ද අමිහිරිවේ.

ඒ අනුව වර්තමාන මුස්ලිම්වරුන්ගේ චින්තනය ප්‍රත්‍යවේක්ෂණයට ලක්විය යුතුය. අන්තවාදය යනු ඉතා පටු චින්තනයකි. සෙ.මී හතරක් පලල් පයිප්පයකින් එන ජලය සෙ.මී භාගයක පයිප්පයකින් යවන්න ගත්තොත් කඩාගෙන ජලය පිටතට පනින්නාක් මෙන් අන්තවාදයත් එලියට පනී. එහි වේගය භයංකාර වෙයි.

4/21 පහරදීම සිදුකළ ත්‍රස්ථවාදීන් ලෝකයේ විශ්වාස කළේ ඔවුන්ගේ කල්ලිය පමණයි. ඔවුන් අතර පමණක් ඔවුන් සෙනෙහස පවත්වා ඇත. නියම මගෙහි ගමන් කරන්නේ ඔවුන් පමණක් බවත් ඔවුහු උදම් ඇනුවෝය. එම පටු චින්තනය හා එම චින්තනය බිහි කල මානසිකත්වය ඇතිකල විනාශය කෙතරම් දැයි කව්රුත් දනිති.

ඒ වගේම ජාතිවාදි චින්තන හා ආගම්වාදි චින්තන කැවුනු මානසිකත්වය ද මිනිසුන් බෙදා වෙන්කළේය. ඔවුහු යම් පාර්ශවයකට පමණක් ප්‍රමුඛත්වය දෙන්නෝය. අන් සියල්ලම ඈත් කරති. තම සිතෙන් ඉවත් කර දමති.

ත්‍රස්ථවාදිහු මෙම කාරණයේදි පළමු තැන සිටිති. අන්තවාදිහු හා ජාතිවාදිහු දෙවෙනි ස්ථානයේ සිටිති. ඔවුන් දරන ස්ථානය අනුව ඔවුන්ගෙන් සිදු වන හානියද අඩුවැඩි වනු ඇත.

එහෙත් අපගේ අවධානය තිබිය යුත්තේ උදාර චින්තනයන් කෙරෙහිය. එය ආශ්වාද කරමින් තව තවත් පුළුල් කරගත යුතුය. විශාල මනසකින් යුක්තව අපි කටයුතු කළ යුතුය.

විවිධත්වය දෙවිඳුන්ගේ නියමයක් බව ඉස්ලාමය උගන්වයි. ස්වභාව ධර්මයේ හා මිනිස් වර්ගයා තුල විවිධත්වය ස්ථිරව පවතින යථාර්තයකි. මෙම සත්‍යය තේරුම් ගත් අයගෙන් විවිධත්වයට හානියක් සිදු නොවේ.

මලයාසියාව දෙස බලන්න: එහි මුස්ලිම් ජනගහනය 52%කි. ඔවුන් සුළු ප්‍රමාණයකින් බහුතර වර්ගයක් වී සිටිති. එහෙත් එහිදී සුළු ජාතීන්ට මුස්ලිම්වරුන්ගෙන් කිසිදු ප්‍රශ්නයක් නොමැත. එහිදී සුළු ජාතිකයින් අවාසිවලට වඩා වැඩියෙන් වාසි බුක්ති විඳිති. විශේෂයෙන් චීන ජාතික බෞද්ධයෝ මලයාසියාවේ ආර්ථිකයේ සැලකිය යුතු කොටසකට හිමිකම් කියති. ඔවුන්ට පූර්ණ ආරක්ෂාව ලැබේ. ඔව්හු සතුටෙන් ජීවත්වෙති.

පුළුල් ආකල්ප, පලල් මනස, විශාල මනස යන්නට මෙවැනි උදාහරණ තවත් පෙන්වාදිය හැකිය. මුස්ලිම්වරුන් මෙවැනි උදාහරණවලට අයත් පිරිසක් වශයෙන් ශ්‍රීලංකාවේ ජීවත්විය යුතුය.

# 14

## මුස්ලිම් දේශපාලනය

සිංහල දේශපාලනය, දෙමළ දේශපාලනය, මුස්ලිම් දේශපාලනය වශයෙන් ශ්‍රීලංකාවේ දේශපාලනය එක් එක් දිශාවට ගමන් කිරීමෙන් කිසිවෙකුටත් කිසියම් යහපතක් සිදු නොවේ. ආණ්ඩු බලය අල්ලාගෙන ආසනවල රැඳී සිටින අයට පමණක් එයින් වැඩි වාසි අත්වන්නේය.

ශ්‍රීලංකාවේ මෙම දේශපාලන ප්‍රවනතාව වෙනස් කළහැකිවේද, නොහැකිවේද යන්න රඳාපවතින්නේ බහුතර ජනයා වෙතය. මෙම දේශපාලන සංස්කෘතිය වෙනස් කළ යුතු බවට සිතන පිරිසක් දැන් බහුතර ජනතාව අතර බිහිවී සිටිති.

මෙම වාතාවරණය යටතේ මුස්ලිම්වරුන් තවදුරටත් අයිතිවාසිකම් ඉල්ලන දේශපාලනයේම නිරතවී සිටින්නේද?

සිංහල දේශපාලනයත් අයිතිවාසිකම් දේශපාලනයක් වී දෙමළ දේශපාලනයත් ඒ වගේම මුස්ලිම් දේශපාලනයත් අයිතිවාසිකම් ඉල්ලන දේශපාලනයක් වශයෙන් වෙනස්වුනොත් මෙම රට යන්නේ කොයිබටද? මෙවැනි දේශපාලනය නිසා ජාතිවාදය මුවහත්වී ඇත. රටේ දේශපාලනය මේ ආකාරයෙන් ගියහොත් දේශපාලඥයින් හැර අන් කිසිවෙකුට යහපතක් සිදුනොවන්නේය. ශ්‍රීලංකාවේ අනාගතය එකිනෙකාට විරුද්ධවන පිටියක් වශයෙන් වෙනස්වනු ඇත.

අපේ දේශපාලනයේ මෙම තත්වය වෙනස් විය යුතුය. දැනට සුක්කානම අතේ තබාගෙන සිටින අයට මේවා ගැන කියා ක්ෂණිකව වෙනසක් ඇති කළ නොහැකිය. එහෙත් අපේක්ෂිත වෙනස වෙනුවෙන් මුස්ලිම් දේශපාලන නායකයින් හා මුස්ලිම් ඡන්ද දායකයින් තමන්ව සූදානම් කළ යුතුය.

එසේ සූදානම් වීමේ යෝජනාවක් මෙසේ ඉදිරිපත් කරමු. මෙම යෝජනාව කරුණු තුනකින් යුක්තයි.

1) ශ්‍රීලංකාව සඳහාම වූ දේශපාලන සංස්කෘතියක් කරා ගමන් කිරීම

2) වින්දිතයින්ගේ හඬ බවට පත්වීම

3) සියලු දෙනාටම සංවර්ධනය යන මාර්ගයේ ගමන් කිරීම

මෙම දේශපාලන මාදිලියේ නම කුමක් දැයි කිව නොහැකිය. එහෙත් රටේ ඇති විවිධ ගැටලු සඳහා විසඳුමක් මෙමගින් ලබාගත හැකිවේ.

මෑතකදී (4/21න් පසුව) සිදුවූ දේශපාලන සටන මෙයට කදිම ආදර්ශයක් බව පෙන්වා දිය හැකිය.

මුස්ලිම් දේශපාලඥයින් වැරදි කර තිබුනේ නම් පාරට බැස උපවාසයේ නිරතවී ඔබ සටන් කළයුතු නැත. නිත්‍යානුකූලව වරද ඔප්පු කරන්න. අප ඉවත් වී ඉඩ ලබා දෙන්නෙමුයි පවසමින් මුස්ලිම් ඇමතිවරුන් ඉල්ලා අස්වූ සිද්ධිය පෙන්වා දුන්නේ එයයි.

එය සියලුදෙනා අවධිකල දේශපාලන සිද්ධියක් වුණු බව කිව හැකිය. මෙවැනි දේශපාලනික එළඹුම් ප්‍රජාවක් වෙනුවෙන් නොව රටක් වෙනුවෙන් සිදුවිය යුතුය.

මුස්ලිම්වරුන්ගේ දේශපාලන සම්බන්ධතාවය මෙම දිශාවේ ගමන් කරවීම සඳහා ඡන්දය භාවිතා කිරීමේ සංස්කෘතියේ වෙනසක් ඇති කළ යුතුය.

ජාතිවාදී දේශපාලනය, අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන දේශපාලනය, කේවල් කිරීමේ දේශපාලනය, රජුන් තැනීමේ දේශපාලනය, අවස්ථාවාදී දේශපාලනය, කෲරවූ ගැටුම් දේශපාලනය යන සියල්ල

මෙරට අත්විඳ ඇත.

රට දැන් තිබෙන තත්වයට පත්කලේ, එවැනි දේශපාලන ක්‍රමයයි. තවදුරටත් මේ ක්‍රමයම අනුගමනය කරමින් රටේ දේශපාලනය ඉදිරියට ගමන් කරයි නම් එහි අනාගතය ගැන සිතාබැලීම පවා බියකරුය.

ජාතිවාදී උණුසුමේ පහස ලබමින් දේශපාලනයේ නිරතවීමත්, ජනතාවගේ සුභසාධනය හා ගැටළු ආශ්‍රයෙන් බුද්ධිමත් දේශපාලනයේ නිරතවීමත් අතර ඇති වෙනස තේරුම්ගෙන කව්රුන් හෝ ක්‍රියාත්මක කර පෙන්විය යුතුයි නේද?

සහෝදර ප්‍රජාවේ සමහරුන් එවැනි දේශපාලනයක් ගැන උනන්දුවී ඇත. ඔවුන් සමග සමානව සිටිමින් ඉහත දැක්වූ උපදෙස් තුන පදනම් කරගෙන දේශපාලනයේ නිරතවීම ගැන මුස්ලිම්වරුන් කල්පනා නොකරන්නේ මන් ද?

15

# ඉස්ලාමය ක්‍රියාත්මක කිරීමේ න්‍යායන්

ඉස්ලාමයේ මේවා ඇත. එහෙත් ඒවා තිබේදැයි යන්නෙන් ප්‍රශ්න කරනු ලැබූවිට "නැත" ඉස්ලාමයේ සියල්ල ඇතැයි කීමට හැකිවිය යුතුය. එවිටයි එය සම්පූර්ණ මාර්ගයක් වන්නේ. ඒ පදනම මත අල්ලාහ් දෙවිඳුන් විසින් අවසාන වරට එවනු ලැබූ ධර්මදූත මුහම්මද් නබි තුමාට වගකීමක් පවරන ලදි. දර්ශනයේ සහ ව්‍යවහාරයේ කිසියම් අඩුවකින් තොරව සීමාසහිතකම් ඇති නොවී ආගම සම්පූර්ණ කළ යුතුය යන්න එම වගකීමයි.

එවැනි වගකීමක් එතුමාට පෙර එවනු ලැබූ නබිවරුන්ට පවරා නොතිබුණි. ඔව්හු තම කාලය හා පරිසරය අනුව අල්ලාහ්ගෙන් ලද මාර්ගෝපදේශ අනුව සමාජය මෙහෙය වූහ.

අවසාන වක්තෘවරයාගේ ඇවෑමෙන් පසුවද එතුමා සම්පූර්ණ කළ මාර්ගය පූර්ණත්වයෙන්ම පවතී. එහෙත් මුස්ලිම්වරුන් කුමන පරිසරයේ ජීවත්වන්නේ ද එම පරිසරයට සරිලන දෑ ඔවුන් තම ආගමෙන් හා ආගමික අධ්‍යයනයෙන් ලබාගත යුතුය. එම විග්‍රහයට අනුව ඔවුන් ජනයා මෙහෙවිය යුතුය. වෙනත් පරිසරයක ක්‍රියාත්මක කරන දෙයක් අන්ධානුකාරයෙන් ආනයනය කිරීමට ඔවුන් උනන්දු නොවිය යුතුයි. තම පරිසරයට අදාල දෑ වෙනත් පරිසරයකට බලෙන් පැටවීමට ඔවුන්

ඉදිරිපත් පත් නොවිය යුතුයි.

අපේ මුතුන් මිත්තන් අතර සිටි ආගමික විද්වත්තු ඉස්ලාමය ක්‍රියාවට නංවීමෙහිලා මෙම නියමය අතිශයින් අනුගමනය කළහ.

මෙම නියමය අපගේ ප්‍රායෝගික ජිවිතයේදි කෙතරම් සැලකිල්ලට ගනු ලබනවාද යන්න හා කෙතරම් ප්‍රතික්ෂේප වෙනවාද යන්න පිළිබඳව වර්තමාන පරිසරයේදි අප පරිශිලනය කළ යුතුය. මෑත අතිතයේ අපගේ ඇවැතුම් පැවතුම් සිරිත් විරිත් කටයුතු සියල්ල මෙම නිගමනයට අනුකූලව තිබුනේද, සමාජය මෙහෙයවූවන් මෙම නියමය සැලකිල්ලට ගෙන ආගමික මාර්ගෝපදේශ ඉදිරිපත් කළේද, මෙම නියමය සම්බන්ධ වූ අපගේ අවබෝධයන් මතු කරන ලද මතභේද නිරාකරණය කිරීමට සමත් වූයේ ද, වැනි ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම, ආගම සම්බන්ධව නගනු ලබන සැක සංකාවලට පිළිතුරු ලබා දි වැරදි අවබෝධ තුරන් කර මධ්‍යස්ථව කල්පනා කරන්නන්ට ඉස්ලාමයේ මහිමය අවබෝධ කර ගැනීමට හැකිවනු ඇත. ඉන්ෂා (අල්ලාහ් අභිමතය අනුව)

## 16

# ජීවත්කර ජීවත්වීම

ත්‍රස්තවාදීහු විනාශකර විනාශවීම සඳහා ජීවත් වූහ. ලෝකයේ බොහෝ අය කෙසේ හෝ ජීවත්වීමට පුරුදු වී සිටිති.

අප එවැන්නන් මෙන් නොව, ජීවත්කරවීම සඳහා ජීවත්වන උදාර ජීවිතයක් ගතකළ යුතුයි. සාධාරණය ජීවත් කරවිය යුතුය. සාමය ජීවත් කරවිය යුතුය. නිදහස හා මිනිස් අයිතිවාසිකම් ජීවත් කරවිය යුතුය. යහපත් හා යහගුණාංග ජීවත් කරවිය යුතුය. සත්‍යය හා සාධාරණය ජීවත් කරවිය යුතුය. අසහනයට පත් සිත් ජීවත් කරවිය යුතුය. දුප්පතුන් ජීවත් කරවිය යුතුය. අංගවිකලයින් හා විශේෂ අවශ්‍යතා ඇති අය ජීවත් කරවිය යුතුය. අනාථයින් හා අසරණයින් ජීවත් කරවිය යුතුය. ගස්වැල් හා ශාඛ වර්ග ජීවත් කරවිය යුතුය. ස්වභාව ධර්මය පිරිසිදුව හා හරිත පූර්ණව ජීවත් කරවිය යුතුය.

සමස්ථයක් වශයෙන් ප්‍රජාව හා දේශය ජීවත් කරවීම සඳහා හැකි සෑම දෙයක්ම අප කළයුතුය.

මේ සියල්ලට පදනම වන උසස්වූ උදාරවූ චින්තනයක් මුලින් අප සිත්වල රෝපනය කළ යුතුය.

අපි වසර කීයක් ජීවත් වන්නෙමුද කුමක් හා කව්රුත් ජීවත්

කරවන්නට අපි උත්සුක වන්නෙමුද යන්න පිළිබඳව ලයිස්තුවක් පිළියෙල කළහොත් පිළිතුරු කෙසේ වේදැයි තක්සේරු කර බලන්න.

කිසිවෙකුට ඵලයක් නැති ආකාරයට ජීවත්වීම, ජීවිතයේ අර්ථයම ප්‍රශ්නාර්ථයක් බවට පත් කිරීමක් වේ යන්න අප අවබෝධ කරගත යුතුය.

# 17

# පරිත්‍යාගශීලිව ජීවත්වීම

සූරාකෑමෙන් ම ජීවත්වීමට තැත් කරන ලෝකයක අපි ජීවත් වන්නෙමු. ආක්‍රමණයකර, උදුරාගෙන, පැහැරගෙන ජීවත්වන විවිධ කලාවන් ආකර්ෂණීය බැනර් සමගින් හඳුන්වා දෙමින් පවතී. වර්තමාන කුරිරු බලවේග මධ්‍යයේ ලාභ නොමැතිව ආදායමක් නොමැතිව, පුතාට තාත්තා වුවද, බිරිඳට සැමියා වුවද කිසිවක් හෘදයාංගමව පරිත්‍යාග කරන පරාර්ථකාමී සිත් ක්‍රමයෙන් ක්ෂයවෙමින් පවතී. සමස්ථයක් වශයෙන් ලෞකික වාසිවලට පූජනීය ලෙස නමස්කාර කරන භයානක ප්‍රවනතාවයක් වර්ධනය වෙමින් පවතී. ආගම්, ආගමික ස්ථාන ආගම්වල පූජනීයත්ව, යන සියල්ල මෙම පූජාව සඳහා බිලිදීම දක්නට ඇත.

තානාන්තර, මුදල්, ප්‍රශංසාව, යනාදියෙහි මුදුනට ලඟා විය යුතුය යන තන්හාව සමග සිදුවෙන මෙම ලෞකික පූජාවේ දිශාව වෙනස් කිරීමේ බලය කව්රුත් සතුව හෝ තිබේදැයි කනගාටුවිය යුතු නැත. නියතවශයෙන්ම එය ඇත. ආත්මාර්ථකාමයෙන් තොරව පරිත්‍යාග කරන ගුණයෙන් පමණක් මෙම දිශාව වෙනස් කල හැකිය.

මන්දහාසය, ප්‍රියමනාප වචන, ශ්‍රමය, මිළ මුදල්, හෝ අවශ්‍ය වූ විට තානාන්තර පවා පරිත්‍යාග කිරීම දක්වා වූ “පරිත්‍යාගශීලිත්වය“ ව්‍යාප්ත කළ යුතුය.

"ජීවත් කර ජීවත්වීම" යන සංකල්පය ක්‍රියාත්මක කරන්නට "පරිත්‍යාග ශීලිත්වය" නමැති ගුණාංගය අත්‍යවශ්‍ය සාධකයකි.

එම නිසා දන්දීමේ කලාව හදාරා හැකිතරම් පරිත්‍යාග කරන ජීවන රටාවක් වෙනුවෙන් උනන්දු වෙමු.

ප්‍රති උපකාරයක් අපේක්ෂා නොකරමින් පරිත්‍යාග කිරීමේ සංස්කෘතියකට පිවිසෙමු.

අප ජීවත්වන පරිසරයේ අපගේ ශක්ති ප්‍රමාණයට සුළු වශයෙන් හෝ විශාල වශයෙන් හෝ බෙදාහදා ගත හැකි දේවල් කුමක් ද යන්න සිතීම මෙම මානුෂීය ක්‍රියාකාරකමේ පළමු අදියරයවේ.

18

# සිවිල් සමාජයක අවශ්‍යතාවය

ආගම් නියෝජනය කරන ප්‍රජාවන් බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික යනුවෙන් වර්ගීකරණය කළ හැකිය.

වාර්ගිකත්වයේ නියෝජනය සිංහල, දෙමල, මුස්ලිම් හා බර්ගර් වශයෙන් හඳුන්වමු.

ශ්‍රීලාංකිකයින් කුමන නමකින් ආමන්ත්‍රණය කරමුද?

ශ්‍රී ලංකා වැසියන්ගේ ප්‍රධාන ධාරාව හඳුන්වනු ලබන්නේ සිවිල් සමාජය වශයෙනි. එනම් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් යුත් සමාජයයි, එම සමාජය මහා ජල ගැල්මකින් වර්තමානයේ ගසාගෙන ගොස් ඇත. එම ජලගැල්ම වෙන කිසිවක් නොව, වාර්ගික හා ආගමික ප්‍රජාවන්ගේ ආක්‍රමණයයි.

ශ්‍රී ලංකා වැසියන් වර්ගය හා ආගම ඉහල නංවා ජාතිය අමතක කර ඇත. ඒනිසා රටේ ගැටළු ඔවුන්ට නොපෙනේ. රට කුමන තත්වයක තිබුනේද, දැන් ඇවිත් තිබෙන්නේ කොතැනටද. එහි අනාගතය කොයිබටද රට වර්ධන මාර්ගයට යොමු කිරීමට නම් නිරාකරනය කළ යුතු මූලික ගැටළු කවරේ ද යන කරුණු පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කරන්නන්ගේ හිඟයක් පවතී. නොඑසේනම් එවැනි අවබෝධයන් සතු අයට කිසි

බලයක් නොමැත. එලෙස ලියන්නන් හෝ කථා කරන්නන් කිසිවෙකු ගණන් ගන්නේ නැත. ජාතිවාදය කථා කරන්නන් සහ ආගම්වාදය කථා කරන්නන් රටේ ප්‍රබුද්ධ පුද්ගලයින් බවට පත්වී සිටිති.

ජාතිවාදය, ආගම්වාදය කථා නොකර හෝ එසේ කථා කරන්නන්ට සහයෝගය නොදී හෝ කිසිවෙකුට සමාජයේ වැජඹෙන්නට බැරි තත්ත්වයක් රටේ උදාවී ඇත. මෙය සිවිල් සමාජයේ පැවත්ම හා එහි අවශ්‍යතාවය ප්‍රශ්නාර්ථයක් කර ඇත. රට ගැන හා එහි මූලික ගැටළු ගැන අවබෝධයක් නොමැති මිනිස් කණ්ඩායමක් එමගින් බිහිවී ඇත. රටක ජනතාව මෙම තත්වයට පත්වූවිට ඒ රටේ ඉහල පැලන්තියට එය කදිම වාසියකි. ඔව්හු කියනදේ ජනයා විශ්වාස කරති. නැවතත් ඔවුන්ටම ඡන්දය ලබා දෙති.

ඒ අනුව ආගම්වාදී සමාජ, ජාතිවාදී සමාජ තවදුරටත් මුවහත්වේ.

මෙම තත්වයේ දී මුස්ලිම්වරුන්ද ජාතිවාදීන් ලෙස ක්‍රියා කරමින් රටේ යහපත් සිවිල් සමාජයක් පිහිටුමට බාධකයක් නොවී සිටිය යුතුය. යහපත් සිවිල් සමාජයක් බිහි කිරීමට අපේක්ෂා කරන සහෝදර ප්‍රජාව සමග එකතුවී බලවත් සිවිල් සමාජයක් ගොඩනැගීමට මහන්සි විය යුතුය. විශේෂයෙන් ප්‍රජා නායකයින්, ආගමික නායකයින් මෙම ඉලක්කය සාක්ෂාත් කරගැනීමේ අරමුණින් තම ප්‍රජාව මෙහෙයවිය යුතුය.

කිසියම් පක්ෂයට ගැති නොවී එයිනුත් විශේෂයෙන් මුස්ලිම් ප්‍රජා නායකයින් වාර්ගික දේශපාලනයෙන් මිදී රටේ සුභසිද්ධිය වෙනුවෙන් ඉදිරිපත් වූ විට රටේ ගැටළු පිළිබඳ දැනුවත් බව ජනතාගත කලහොත් එය යහපත් සිවිල් සමාජයක් බිහි වීමට අවස්ථාව සලසයි.

## 19

# ආවේගය හා ඉක්මන් වීම

ආවේගය බුද්ධිය මොට කරයි. ඉක්මන්වීම ආවේගයට තුඩුදුන් හේතුවද අමතක කරවයි.

ත්‍රස්තවාදීහු මේ දෙකේම ගොදුරක් බවට පත්වූහ. මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ක්‍රියාත්මක කළ ප්‍රචණ්ඩත්වය හා මුස්ලිම්වරුන්ට හා ඉස්ලාමයට එරෙහිව මුදාහරින ලද වෛරී ප්‍රකාශ නිසා ඔවුහු ආවේගශීලි වූහ. ආවේගශීලිවී අන්තවාදය සොයා ගියහ. පසුව මුස්ලිම්වරුන්ව ඔවුහු අමතක කළහ.

මුස්ලිම්වරුන් ආරක්ෂා කරනවා යැයි සිතමින් ඔවුන්ව ප්‍රපාතයකට තල්ලු කර දැමූහ. ඔවුන්ගේ ආවේග හා හදිස්සිය නිසා ඔවුන් කුමක් කරන්නේ ද යන්න අවබෝධ කරගැනීමේ අවස්ථාව පවා ඔවුනට නොලැබුණි.

මෙවැන්නන් යම් ජාතියට හෝ ආගමට හෝ රටට ගෙන දෙන්නේ විනාශය මය. නිර්මාණාත්මක දෙයක් ඔවුන් ගෙන දෙන්නේ නැත.

ත්‍රස්තවාදීන් හා ඔවුන් හා සම්බන්ධවූවන් හැර අනෙකුත් මුස්ලිම්වරුන් තමන්ට විරුද්ධ ප්‍රචණ්ඩත්වය හා වෛරී ප්‍රකාශ නිසා සිත් තැවුලට පත්වූවද ඊට එරෙහිව සටන් කිරීමට ඉදිරිපත් නොවීම පිළිබඳව

සැබැවින්ම ප්‍රසංගා කළ යුතු කාරණයකි. එම තත්වය තවත් බලාත්මක කළ යුතුය. එම තත්වය කෙලෙසීමට ඇතැම් නපුරු බලවේග ක්‍රියා කරයි යන්න අමතක නොකරමින් කටයුතු කළ යුතුය.

ආවේගයට බිලිවීමේදී යහපත් අයද අන්තවාදයට පා තබති. ආවේගවූවන් ඉක්මන්වීමේදී ප්‍රචණ්ඩත්වයට පා තබති.

ඒ නිසා අප පරීක්ෂාවන්ට මුහුණ දිය යුත්තේ සන්සුන්වය. ආවේග ශීලිව ඉක්මන්වී සියළු කටයුතු තමන් අතට ගැනීමට කව්රුත් යුහුසුළු නොවිය යුතුයි.

ආවේගශීලිවීම පිළිබඳ කලින් සඳහන් කළ ආකාරයෙන් සහනශීලී භාවයක් මුස්ලිම්වරුන් තුල පැවතියත් ඔවුන් තුල පවතින අයහපත් දෑද පෙන්වාදිය යුතුව ඇත.

සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් හා හන්දියක් ගානේ සිටගෙන ඔලුවට එන සියල්ල මුදා හරින්නන්, පුරාජේරු කථා සමච්චල් කථා හුවමාරු කරගන්නන් ඒවා නැවත්විය යුතුය. දැනුවත්ව හා සාධක ඇතුළු කරන කථා පමණක් සමාජයේ පිළිගැනීමට ලක්වන්නේය. ඒවා කිරුමක් මිණුමක් නැතිව කට තිබෙන පළියට කතා කරගෙන යන අයව නිතර ඝෝෂා නගන සත්ව කොට්ඨාශයක් ලෙස සැලකිය යුතුයි.

ආවේගශීලි නොවන හා සාවධානයෙන් කටයුතු කරන ප්‍රජාවක් වශයෙන් සිටීමට උත්සාහ කළයුතුය. ඒ සඳහා වූ මගපෙන්වීම් සැමට ලබා දිය යුතුය.

20

# පසුබෑමට ඉගෙන ගැනීම

පරීක්ෂාවන් විවිධයි, එයින් ප්‍රධාන දෙකක් ගැන සඳහන් කළ හැකිය.

1. විනාශය කරා ගෙන යන පරීක්ෂාව

2. අවස්ථාව ලබා දෙන පරීක්ෂාව

සාමාජයක පිබිදීම හා බිඳවැටීම පිළබඳ දේව නියමයන් අනුව කිසියම් ප්‍රජාවක් ලෝකයේ ජීවත්වීමේ සුදුසුකම අහිමි කරගත්විට එම ප්‍රජාව විනාශ කරන පරීක්ෂාවක් අල්ලාහ් දෙවිඳුන් විසින් පහළ කරනු ලැබේ.

එවැනි පරීක්ෂා පෙර නබිවරුන්ගේ ප්‍රජාවෙත පතිත විය. එවැනි පරීක්ෂාවක් පැමිණියහොත් එහි අවසානය විනාශයයි. ලොවේ එවැනි ප්‍රජාවකට යලි නැගිටීමක් නොමැත.

අවස්ථාව දෙන පරීක්ෂා එසේ නොවේ. පරාජයෙන් ඉගෙන ගෙන, අඩුලුහුඬුකම් සපුරාගෙන තමන් නිවැරදි කරමින් වැරදි තක්සේරු වෙනස් කර අධිතක්සේරුව අවම කරගෙන තමන් නිවැරදි කර ගැනීමට දෙන අවස්ථාව දෙවැනි වර්ගයවේ.

“ඔබට සිදුවෙන කුමන පරීක්ෂාක් වුවද, එය ඔබේ දෑත උපයාගත් දෑ මය. (ඔබේ වැරදිවලින්) බොහෝ (වැරදිවලට) (දඬුවම් නොකර)

ඒවා අල්ලාහ් කෂමා කරයි."

යන කුර්ආන් උපදේශය මෙහිදී අප සැලකිල්ලට ගත යුතුය. පසුතැවිලි, පරීක්ෂා, පරාජය කුමක් වුවත් ඒවා කෝණ දෙකකින් අප බැලිය යුතුය.

(1) නියමිත පසුබෑමට බලපෑ ලෝක පරිසරය කොයිබටද; එම පරිසරයේ දී කවිරුන් විසින් කාහට අසාධාරණ සිදුවුණි ද ඒවාට මුහුණ දීමේ නීතිමය හා සාමකාමී ක්‍රමවේද මොනවාද යන ආකාරයෙන් බැලීම

(2) නියමිත පසුබෑමට ලක්වූවන් තම තත්වයෙහි ඇති කළ යුතු වෙනස්කම් මොනාවද? ඇතිවූ පරාජයට හෝ පසුබෑමට බලපෑ අභ්‍යන්තර හේතු කවරේද? අඩුලුහුඬුකම් මොනවාද? අධි තක්සේරු මොනවාද යනාදිය හදාරා නිවැරදි කළයුතු ද යන මැයෙන් බැලීම

කුර්ආනය අපට ආරාධනය කරන්නේ මෙම මාර්ගයේ බව අප අවබෝධ කරගත යුතුය. පසුබෑමේ වගකීම පිළිගන්න. පසුබෑමට හේතු අනුන් මත පටවා සියල්ල අල්ලාහ්ගේ පෙර නියමයන් යැයි කියමින් තිත නොතබන්න. එවිට ඔබට කිරීමට කාර්යයක් ඉතිරිවන්නේ නැත. ඒ අනුව ඔබ වගකීම් රහිත පුද්ගලයෙකු බවට පත්වේ. පසුබෑම පිළිබඳ හදාරා ඉදිරියට යාමේ මාර්ගය අනාවරණය කරගන්න; යන්න එම ආරාධනාවයි.

පුද්ගලයෙකු හෝ ප්‍රජාවක් හෝ තමන්ට එන දුෂ්කරතා, පරීක්ෂා, පරාජ, පසුබෑම් යනාදියට වගකිව යුත්තේ අභවලාය. අභවල් අය නිසයි ගැටළුව ඇතිවුනේ යනුවෙන් වෙනත් අයගේ පිට පැටවීමට උත්සාහ කරන අය කිසිවිටකත් දියුණුවන්නේ නැත.

අභවලාය වගකිව යුත්තේ යන්න සාධක සහිතව ඔප්පුකර සාධාරණය ලබා ගැනීමට උනන්දුවීම ලෝක සම්මතය වේ. අඩුලුහුඬුකම් මගහරවා වැරදි නිවැරදි කරගෙන නිසිමගට යොමුවීම ආගමික සම්මතය වේ. මේ දෙක ඉටුකළවිට වාහනයක රෝදවල "එලයින්මන්ට්" නිවැරදිව සකස් කර ඇති බව එහි අර්ථයයි. ඉන් එකක් ඉවත් කර එකක් පමණක් සවි කලවිට එක් රෝදයක හුළං බැස ඇත යන්න එහි අර්ථයයි.

## 21

# දෘෂ්ටි කෝණ දෙකක්

4/21 ත්‍රිස්ටවාදී පහර දීමෙන් පසු මුස්ලිම්වරුන් දෙස දෙආකාරයෙන් බලන පිරිස් හඳුනාගත හැකිය.

(1) එක් පාර්ශවයක් 4/21 ප්‍රහාරයට ශ්‍රීලංකා මුස්ලිම් ප්‍රජාව ඍජු සම්බන්ධයක් නොමැති බව තරයේ විශ්වාසය කරති. භයානක න්‍යාය පත්‍රිකාවක එක් අංගයක් වශයෙන් මෙම පහර දීම සිදුවී ඇති බවත් මෙම පහරදීම ආශ්‍රයෙන් වාසි ලැබීමට අදහස් කළ අය එය ලබාගන්නා බවත් ඔවුන්ගේ ස්ථාවරය වී ඇත. මෙම ස්ථාවරයේ සිටින අය මුස්ලිම්වරුන් දෙස බලා ”ඔබ කලබලවිය යුතු නැත. වැරදි කළ මානසිකත්වයෙන් ජීවත්විය යුතු නැතඃ නිදහසේ ජීවත්වෙන්න! ඔබ සියළු දෙනාම ශ්‍රී ලංකාවේ පුරවැසියැයි පවසති.

මෙම පාර්ශවයේ අයට සියළු දෙනාම ස්තුතිවන්ත විය යුතුය. සත්‍ය ගවේෂණයෙන් ක්‍රියා කරන මොවුන් දෙස බලා අපත් කුමන අර්බුදකාරී පරිසරයක වුවද සත්‍යය අනාවරණය කරමින් ක්‍රියා කිරීමට උත්සාහ කළ යුතුය.

(2) තවත් පාර්ශවයක් 21/4 පහර දීම මුළුමනින්ම මුස්ලිම්වරුන්ගේ සහ ඉස්ලාමයේ හිසමත පටවා ඔබ සමග අප මින් පසු ජීවත්විය හැකිදැයි ප්‍රශ්න කරති. වසර දහසකට වැඩි කාලයක් මෙරටේ මුස්ලිම්වරුන්

ජීවත්වී ඇත. ඔවුන් කිසිවිටකත් අපට විරුද්ධව නැගී සිටියේ නැත. රටට එරෙහි කුමන්ත්‍රණ කළේද නැත. කුර්ආනයට වැරදි අර්ථකථනය යොදාගෙන ඇතැමුන් කරනවා වගේ මිනිස් ඝාතනයේ නිරතවූයේද නැත. ඔවුහු සියළු වාර්ගිකයන් සමග සංහිඳියාවෙන් ජීවත් වූහ. ආගමානුකූලව ඉවසීමෙන් යුතුව කටයුතු කළහ. යන සියල්ල අමතක කරමින් ඉහත ආකාරයට චෝදනා කරන්නට පටන් ගෙන ඇත.

මොවුන් සත්‍යයෙන් ඔබ්බට සාධාරණයෙන් ඔබ්බට ගොස් කුමක් හෝ වෙනත් දෙයක් පිළිබඳව ඇළුම් කරන බව පෙනේ.

යතාර්ථය නම් මුස්ලිම්වරුන් දෙස බලා ඔවුන් කිසිසෙත්ම බිය විය යුතු නැත. සියළු බලතල සියළු සම්පත්, රටේ බහුතරය සතුය. සංහිඳියාවෙන් ජීවත්වෙන මුස්ලිම්වරුන් සමග ඕනෑම ප්‍රශ්නයක් සාකච්ඡාවෙන් නිරාකරණය කරගත හැකිය. එහෙත් එයට අකැමැති පිරිසක් සිටින බව පෙනේ.

වසර දහසක් ජීවත් වූ මුස්ලිම්වරුන්ගේ ක්‍රියාකලාපයට වඩා මෑත සිදුවීම හා සම්බන්ධ කල්ලියගේ ක්‍රියාව වැඩියෙන් විශ්වාස කරන තත්වයක් උගතුන් තුල පවා බිහි වී තිබේ. මෙය අනපේක්ෂිත තත්වයකි.

මෙම තත්වයේදී ඔවුන් සෑහීමට පත්වීම සඳහා අපට කළ හැකි දෙයක් නැතිවුවද මුස්ලිම්වරුන්ට එරෙහිව නගන චෝදනා මධ්‍යයේ මුනිවත රැකීමේ හැකියාවක්ද නැත.

පදනම් විරහිත ව්‍යාජ, චෝදනා බුද්ධිමත්ව සලකා බලා සාධක තිබේදැයි සොයා බලන ලෙස ඉල්ලා සිටිමු.

ඔවුන් අනාවබෝධයෙන් ඉදිරිපත් කරන චෝදනාවලට ප්‍රියමනාප ලෙස හා බුද්ධිමත් මාර්ගයෙන් විග්‍රහ ලබාදිම කළ යුතුය.

ඔවුන් අකමැති දෑ අප තුල තිබෙනවානම් ඒවා ආගමට පටහැනි දෑ නොවෙයි නම් වෙනස් කර ගැනීම කෙරෙහි අප අවධානය යොමු කළ යුතුය.

අප පොදු කටයුතුවලදී, ගැටළුවලදී ඔවුන් සමග සම්බන්ධවී

ක්‍රියාකළ යුතුය. ඒ සමග අපට එරෙහි අදහස් දරන්නන් විවේචනය කරමින් ඔවුන් දුරස්ථ නොකර සත්‍ය තත්වය ඔවුන් සමග සාකච්ජා කිරීමේ අවස්ථා බිහි කළ යුතුයි.

අප හා ඔවුන් අතර පවතින පොදු කරුණු හා ගැටළුවලදී අප දෙපිරිස එක්වී සාකච්ජා කරන්නට කටයුතු කළ යුතුයි.

මේ සියල්ලට පසු ඉතිරි කරුණු අල්ලාහ් වෙත පැවරිය හැකිය. එවිට අපගේ වගකීමේ නිමාවේ. අපගේ විෂයෙහි අල්ලාහ්ද තෘප්තිමත් වනු ඇත.

## 22

# ජීවිතය අලංකාර කිරීම

සෑම දෙයකින්ම ලාභයක් අපේක්ෂා කරන්නෝ ජීවිතය බාල්දු කර ගනිති. සේවය කිරීමේ ආකල්පයෙන් ජීවත් වන්නෝ ජීවිතය අලංකාර කර ගනිති.

ලාභාපේක්ෂාවෙන් ජීවත්වන උදවිය ආත්මාර්ථකාමය තන්හාව, හිතුවක්කාරකම, එරෙහිවීම, තර්කය, පටු ආකල්ප, අනුන් නොරිස්සීම සත්‍ය නොපිළිගැනීම, පොරොන්දු කඩ කිරීම, බොරුව, රැවටීම, ආදියෙන් ජීවිතය අශික්කිත කර ගනිති.

සේවා ආකල්පයෙන් පිරුණු අය පරාර්ථකාමය, පරිත්‍යාගය, මෘදුබව, සෙනෙහස, සහෝදරත්වය, මානව හිතවාදය, එකඟවීම, පුළුල් ආකල්ප, අනුන්ගේ නිදහසට ගරු කිරීම සත්‍යය පිළිගැනීම අඩුපාඩු හදා ගැනීම, නිහතමානී බව වැනි උදාර ගුණාංගවලින් තම ජීවිතය අලංකාර කරගනිති.

ජීවත් වුනත් මැරුණත් දෙවෙනි වර්ගයට අයත් කෙනෙකු වශයෙන් ජීවත්වීමට සියළු උත්සාහ දැරිය යුතුය.

23

# කාන්තා කටයුතු

කාන්තාවන් සම්බන්ධයෙන් පිරිමින් අතීතයේ සිටම මෙතෙක් පවත්-වාගෙන එන ප්‍රවේශ වර්ග තුනකි. එම ප්‍රවේශ තුන හේතුවෙන් දෘෂ්ටිකෝණ තුනක් බිහිවී ඇත. මිනිස් වර්ගයාගෙන් හරි අඩක් වන කාන්තාවන් සම්බන්ධයෙන් ගනු ලබන තීරණ සමාජ දෘෂ්ටිකෝණය නොවෙනස් කර තිබිය නොහැකිය.

*1.* කාන්තාවන් දැඩි ලෙස වසා තබා සමාජ ප්‍රවාහයෙන් ඔවුන්ට සඟවා තබන දෘෂ්ටි කෝණය

*2.* කාන්තාවන් සම්පූර්ණයෙන්ම විවෘත කර පිරිමින්ට විරුද්ධ පාර්ශවය වශයෙන් ගෙන සියළුම කටයුතුවල කාන්තාවන් පිරිමින් සමග තරඟවදින දෘෂ්ටි කෝණය

*3.* පිරිමින් සමග කාන්තාවන් එකතු වී කාන්තා පිරිමි සම්බන්ධතා සඳහා වූ සීමාවන් ආරක්ෂා කරමින් තම ස්වභාවයන් හා දක්ෂතාවයන් අනුව නිර්මාණාත්මක කාර්යවල නිරතවී සමාජ ප්‍රවාහයේ කාන්තාවන් ද දායක වන දෘෂ්ටි කෝණය

මෙම දෘෂ්ටිකෝණ තුන විවිධ ගුණාංගවලින් හා මනෝවිද්‍යාත්මක හැසිරීම්වලින් යුක්තය. ජීවන චක්‍රය කරකවීමේදී හෝ දිශාමුඛ කිරීමේදී

ඒවා වැඩි බලපෑම් කිරීමට සමත්වේ.

මුහම්මද් නබිතුමාණන් මෙයින් තුන්වෙනි දෘෂ්ටිකෝණ අනුව තම ප්‍රජාව ගොඩනැගූහ. එම දෘෂ්ටි කෝණයට අවශ්‍ය ගුණාංග හා සීමාවන් එතුමා පැහැදිලි කළහ. මිනිස් සමාජය පොදුවේ මෙම දෘෂ්ටි කෝණට ස්වභාවයෙන්ම ඇළුම් කරන තත්වයේ සිටී.

"කාන්තාවන් පිරිමින්ගේ හරි අඩකි" යන්න නබිවදනකි.

විශ්වාසවන්තයින් වන පිරිමින් හා විශ්වාසවන්තයින් වන කාන්තාවන් යහපත වර්ධනය කර අයහපත අවම කර එකිනෙකාට සහායවී උදව් කරන්නන් වශයෙන්ම සිටිති. (කුර්ආන් 9:71)

මෙම නබිවදන් හා කුර්ආන් වැකි ඉහත තුන්වන දෘෂ්ටිකෝණයට පක්ෂය වර්තමාන පරිසරයේ කාන්තාවන් සම්බන්ධයෙන් අපද එය පිළිපැදිය යුතුය.

අනෙක් දෘෂ්ටිකෝණ දෙක නබිතුමාගේ වදනට පටහැනි බව අප සැලකිල්ලට ගත යුතුය. එමෙන්ම මානවයාගේ යථාර්ථ ජීවිතයට ද එය පටහැනි බව ඔප්පු කළ හැකිය.

24

## ඉස්ලාමය විදහා දැක්වීම

ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ශ්‍රී ලංකා ජනතාව ඉදිරියේ දිස්වෙන ඉස්ලාමය ප්‍රදර්ශණය කිරීමේදී එහි තිබිය යුත්තේ කුමන කරුණු ද නොතිබිය යුත්තේ කුමන කරුණු ද යන්න පිළිබඳ තීරණය කරන්නේ-න් කව්රුන්දැයි මොහතකට කල්පනා කරන්න" ප්‍රදර්ශණයේ දැනට ඉස්ලාමය වශයෙන් විදහා දක්වන චිත්‍රය කුමන වර්ගයේ එකක් ද යන්නත් මොහොතකට කල්පනා කර බලන්න"

එම ප්‍රදර්ශණ වල තැබිය යුතු බොහෝ දේවල් ඇත" ඒවායෙන් සමහරක් උදාහරණය වශයෙන් බලමු.

ආදරය හා සහෝදරත්වය

සත්ව කරුණාව

මිනිස් සුබසාධනයට වැඩි සැලකිල්ල

ජනයාගේ ගැටළු (මුස්ලිම්වරුන්ගේ පමණක් නොව) විසඳීම සඳහා සියළු දෙනා සමග අත්වැල් බැඳගැනීම හා හඬ නැගීම

විශේෂයෙන් ආගමේ නාමයෙන් වූ අත්තවාදයට එරෙහිව ක්‍රියාකිරීම

අන්තවාදයට හා ආගමික වෛරයට ඉඩ ලබා නොදීම

සාරධර්ම පිළිබිඹු කරන ජීවිතය

බුද්ධිමත් ප්‍රවේශ (අපිරිසිදු හෝ ලාභ උපයන හෝ නොවන)

ප්‍රජා අතර සම්බන්ධතාව, අන්‍යෝන්‍ය සහයෝගය

ශ්‍රී ලංකාවේ පුරවැසියා යන්නෙන් දේශය සමග ඇති බැඳීම ඒ හා ආශ්‍රිත වගකීම් පැහැදිලි වන

නීතිය හා සාමය ආරක්ෂා කිරීම

කාන්තා සහභාගිත්වය

වැනි බොහෝ කරුණු සනාථ කරන ආකාරයේ විදහා පෑමකට විරුද්ධව දැනට Display වන දේවල් ඉවත්කළ යුතුය. එසේ ඉවත් කළ යුතු කරුණුවල ලැයිස්තුවක් එක් එක් ගමකම පිළියෙල කළ යුතුය. සාකච්ඡා මාර්ගයෙන් ඒවායින් ඉවත් කළ යුතු ඒවා ඉවත් කිරීමේ කටයුතුවල ද නිරත විය යුතුය.

## 25

# දෙවිඳුන් සමග සම්බන්ධතා

මේ සියල්ලට ම අවසානයක් වශයෙන් ද ආරම්භයක් වශයෙන්ද අහසේ පොලොවේ හා ජිවීන්ගේ හා අපිවින්ගේ ආරක්ෂකයාවන අල්ලාහ් දෙවිඳුන් ආශ්‍රයට අප පත්විය යුතුය. අපගේ ශක්තිය හා දුර්වලතා රඳාපවතින්නේ අල්ලාහ්ගේ සම්බන්ධතාවයෙන් ඇතිවෙන ශක්තියෙහි හා දුර්වලතාවෙහිය.

මෙය පෞද්ගලික සම්බන්ධතාවයක් මිස සාමුහිකව හෙලිකරන සම්බන්ධතාවයන් නොවේ. සාමුහිකව ඉටු කරන ලෙස අල්ලාහ් අණ කළ නමැදුම, සකාතය, හජ් වැනි වගකීම්වලදී මෙම සම්බන්ධතාවය අප සාමුහිකව හෙලිකළ යුතුමය.

ඒ අතර මෙම අවස්ථා වලින් පමණක් අල්ලාහ් සමග ඇති සම්බන්ධතා නිමාවන බව අප නොසිතිය යුතුයි. වෛකල්පිත (සුන්නත්) යුතුකම් වන උපවාස, තහජ්ජුත්, විත්ර්, දික්ර්, තව්බා, ඉස්තිඃෆාර්, උදේ සවස පාරායනයන් කුර්ආන් පාරායනය, හැකි උපරිම අයුරින් ආගමික දැනුම ලබාගැනීම, උගත් දේ අනුව පිළිපැදීම යහපත් මිනිසුන් සමග ආශ්‍රය කිරීම වැනි අල්ලාහ් සමගවූ සම්බන්ධතා වැඩිකිරීමේ මාර්ග ඔස්සේ එක් එක් මුස්ලිම්වරයෙක්ම හදවතෙන්ම තම දෙවිඳුන් සමග සම්බන්ධතාවය තර කළ යුතුය. සම්බන්ධතා ගොඩනැගිය යුතුය.

එම අභ්‍යන්තර සම්බන්ධතාවයේ කරුණු දෙකක් වැඩි වශයෙන් බලපෑම් කරයි.

(1) දයාවෙන් අල්ලාහ්ට සමීප වීම

(2) අපගේ වැරදි අපට අවබෝධ කරදෙන පව් සමාව (ඉස්තිඃෆාර්) මාර්ගයෙන් අල්ලාහ්ට සමීප වීම

මෙවැනි සම්බන්ධතා දිනක් නෑර, මොහොතක් නෑර නොකඩවා අළුත් කර ගන්නා විට අනෙකුත් වත්පිළිවෙත් හා යහක්‍රියාද බලවත් වීමේ තත්වයක් උදාවේ.

මේ සමගින් ආගමික ඉගැන්වීම්වලට අනුකූලව හා පරිසරයට සුදුසු ආකාරයටත් අප කරන සියළු ක්‍රියාකාරකම් ද අල්ලාහ් සමග සම්බන්ධතාවය වර්ධනය කරන ඒවා වේ.

එම සම්බන්ධතා ඉහත සඳහන් කරන ලද හා ඉන් බාහිර ක්‍රමාවේද මගින් සවිමත් කරන විට අපගේ ප්‍රාර්ථනාවන් සක්‍රිය හා බලපෑම් ඇති කරන තත්වයකට පරිවර්තනය වේ.

එක් එක් මුස්ලිම්වරයෙක්ම අල්ලාහ් සමග වූ සම්බන්ධතාවය තරකර තම ප්‍රාර්ථනා අනුමතවන තත්වයකට වර්ධනය කරගත හැකිනම් අපගේ මෙලොව පරලොව ජීවිතයට එයට වඩා විශිෂ්ඨ දායාදයන් නොමැති තරම්ය.

අල්ලාහ් අප හා අපගේ ක්‍රියා අනුමතකර අපගේ මෙලොව පරලොව ජීවිතය උසස් තත්වයකට නංවත්වා!

සිංහල පරිවර්තනය

**එම්.එච්.එම් හසන්**